ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

මගේ අංකය / My No : MOD/CSD/DeM/30
ඔබේ අංකය / Your No :

තැ. පෙ. / P.O. Box 572 | දුරකථන / Telephone 2430860-9, 2430870-8 | ලේකම් / Secretary: දුර./Tel : 011 2381154, ෆැක්ස් /Fax : 011 2541529, ඊ මේල් /Email : secdefence@defence.lk

දිනය / Date: 2025.12.24

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත,

<u>පුපුරන ද්‍රව්‍ය හා පතරොම් නිකුත් කිරීම නියාමනය කිරීමේ චක්‍රලේඛය සංශෝධනය කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් චක්‍රලේඛ අංක 01/2024 දරණ MOD/CIS/07/EX/1/38 හා 2023.12.18 දින මා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා බැඳේ.

02. ඉහත චක්‍රලේඛයේ 02 වගන්තිය පහත පරිදි සංශෝධනය කර 2026.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

> "1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව පුපුරන ද්‍රව්‍ය පාලක වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ. 37 වගන්තියට ප්‍රකාරව පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා බලපත්‍ර අධිකාරී වන්නේ අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වේ. පනතේ 5(2) වගන්තිය ප්‍රකාරව එම බලපත්‍ර අධිකාරී විසින් ස්වකීය බලතල හෝ රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී හෝ ක්‍රියාවට නැංවීමේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ (පුපුරන ද්‍රව්‍ය පාලකගේ) සාමාන්‍ය විධානයන්ට හෝ විශේෂ විධානයන්ට හෝ යටත්ව ක්‍රියා කරනු ලැබිය යුතුය. පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමේ රාජකාරි විෂය බලපත්‍ර අධිකාරී වන දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරේ. තවද ඔබ විසින් ස්වකීය බලතල හෝ රාජකාරි ක්‍රියාවට නැංවීමේදී පුපුරණ ද්‍රව්‍ය පනත යටතේ මවිසින් ඔබ වෙත අනුයුක්ත කර ඇති සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකවරුන්ගේ සහාය ද ඇතිව ඔබ හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව අයදුම්පත් යොමු කල යුතු අතර, බලපත්‍ර/අවසරපත්‍ර නිකුත් කිරීමේදී ද එලෙස කටයුතු කල යුතු වේ."

එයාර් චීෆ් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යනය-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩියූ (චීනය), පීඑස්සී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත්-

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ග.ස හා අ.ක.ය.
2. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී - කරු. දැ.ග.ස
3. යුද්ධ හමුදාපති - කරු. දැ.ග.ස හා අ.ක.ය.
4. නාවික හමුදාපති - කරු. දැ.ග.ස හා අ.ක.ය.
5. පොලිස්පති - සියලුම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන්, පොලිස් අධිකාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම සඳහා
6. අධ්‍යක්ෂ ජනරාල් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - කරු. දැ.ග.ස. හා කැණීම් පිළිබඳ වාර්තා ලබාදීම සඳහා
7. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය - කරු. දැ.ග.ස හා අ.ක.ය.
8. සාමාන්‍යාධිකාරී, ශ්‍රී/ය ශ්‍රී ලංකා රජයේ (විවිධ) නීතිගත සංස්ථාව - කරු. දැ.ග.ස හා අ.ක.ය.
9. සියළුම සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකවරුන් - කරු. දැ.ග.ස හා අ.ක.ය
10. අධ්‍යක්ෂ, නාවික හමුදා CEFAP ඒකකය - කරු. දැ.ග.ස හා අ.ක.ය.

# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

තැ. පෙ. / த. பெ.இ / P.O. Box } 572 | දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary } දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්/பெ./Fax.: 011 2541529, ඊ. තැපැල/மி.அ./Email : secdefence@defence.lk


දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
4934
21 MAR 2024
8ve 86
ගාල්ල

මගේ අංකය / எனது இல / My No } MOD/CIS/07/EX/1/38
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2024.03.16

සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත,

**<u>පුපුරන ද්‍රව්‍ය හා පතරොම් නිකුත් කිරීම නියාමනය කිරීමේ චක්‍රලේඛය සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් චක්‍රලේඛ අංක 01/2024 දරණ MOD/CIS/07/EX/1/38 හා 2023.12.18 දින මා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා බැඳේ.

02. ඉහත චක්‍රලේඛයේ 17 (1) (අ) කෘෂිකාර්මික ඡේදය පහත සඳහන් පරිදි සංශෝධන කර 2024.03.18 වන දින සිට ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

> කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා දී ඇති තුවක්කුවලට පතරොම් නිකුත් කළ යුත්තේ ඔබ විසිනි. එම තුවක්කුවලට අවුරුද්දේ මුල් භාගය (මුල් මාස හය) ඇතුළත උපරිම වශයෙන් එස්. ජී. පතරොම් 20 (විස්සයි) හා සැහැල්ලු ප්‍රමාණයේ (අංක 4, අංක 6 හෝ අංක 8) පතරොම් 10 (දහයයි) යුක්තව හෝ තනිකරම සැහැල්ලු ප්‍රමාණයේ පතරොම් වලින්ම නිකුත් කළ හැක. මෙම ප්‍රමාණයම අවුරුද්දේ දෙවන භාගය වෙනුවෙන් ද නිකුත් කළ හැක.
> තුවක්කු බලපත්‍ර සඳහා නව චක්‍රලේඛයෙන් මුල්වරට පතරොම් නිකුත් කිරීමේදී අමතර පතරොම් ප්‍රමාණය හා නව තුවක්කු බලපත්‍රය සඳහා පතාරාම් නිකුත් කිරීමේදී හිස් පතරොම් කොපු නොමැතිව නිකුත් කළ හැකිය. ඒ හැර අනික් සෑම අවස්ථාවකදී නිකුත් කළ යුත්තේ තුවක්කු බලපත්‍රලාභියා විසින් භාර දෙනු ලබන පාවිච්චි කරන ලද හිස් පතරොම් කොපු ප්‍රමාණයට සමාන ප්‍රමාණයකි. තවද ඉහත පතරොම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන තුවක්කු බලපත්‍රලාභීන්ගේ ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් තීරණය කර ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

ඩී.එම්. සමන් දිසානායක
අතිරේක ලේකම්
සිවිල් ආරක්ෂක හා සංවර්ධන

අත්/කලේ
ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීසී පීඑස්සී එම්පිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත් :-

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය :- කා.දැ.ස. හා අ.ක.ස.
2. පොලිස්පති :- සියලුම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරින්, පොලිස් අධිකාරින් හා පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම සඳහා
3. සියලුම සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකවරුන් :- කා.දැ.ස. හා අ.ක.ස.
4. අධ්‍යක්ෂ, නාවික හමුදා CEFAP ඒකකය :- කා.දැ.ස. හා අ.ක.ස.

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

මගේ අංකය / My No: MOD/CIS/07/EX/1/38
ඔබේ අංකය / Your No:

තැ. පෙ. / P.O. Box 572
දුරකථන / Telephone 2430860-9, 2430870-8
ලේකම් / Secretary — දුර./Tel. : 011 2381154, ෆැක්ස්/Fax.: 011 2541529, වි. තැපෑල/Email : secdefence@defence.lk
දිනය / Date: 2023.12. 18


චක්‍රලේඛ අංක 01/2024

සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත,

## පුපුරන ද්‍රව්‍ය හා පතරොම් නිකුත් කිරීම නියාමනය කිරීම

පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමේදී ව්‍යවසායකයන්ට මුහුණ පෑමට සිදුවන අපහසුතා අවම කිරීම හා නියාමනය ශක්තිමත් කිරීම අරමුණු කර ගෙන 2024.01.01 දින සිට මෙම චක්‍රලේඛයේ දී ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි. එමෙන්ම මීට පෙර පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම සම්බන්ධව නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ උපදෙස් මෙයින් අවලංගු කරන බැව් වැඩිදුරටත් දන්වමි.

02. 1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව පුපුරන ද්‍රව්‍ය පාලක වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ. 37 වගන්තියට ප්‍රකාරව පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා බලපත්‍ර අධිකාරී වන්නේ අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වේ. පනතේ 5(2) වගන්තිය ප්‍රකාරව එම බලපත්‍ර අධිකාරී විසින් ස්වකීය බලතල හෝ රාජකාරී ක්‍රියාත්මක කිරීමේදී හෝ ක්‍රියාවට නැංවීමේදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ ( පුපුරන ද්‍රව්‍ය පාලකගේ ) සාමාන්‍ය විධානයන්ට හෝ විශේෂ විධානයන්ට හෝ යටත්ව ක්‍රියා කරනු ලැබිය යුතුය. පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමේ රාජකාරී විෂය බලපත්‍ර අධිකාරී වන දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරෙන අතර දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙනුවෙන් අදාල දිස්ත්‍රික්කයට මා විසින් පත් කරන ලද සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් එම විෂය පිළිබඳ සියලුම කාර්යයන් ඉටු කළ යුතු වන්නේය.

03. පුපුරන ද්‍රව්‍ය පනතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාවට නංවනු පිණිස බලපත්‍ර අධිකාරී/සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වන ඔබ වෙත ලැබෙන සෑම අයදුම්පතක් සම්බන්ධයෙන් පහත දක්වා ඇති උපදෙස් අනුගමනය කළ යුතුය.

## 04. පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීම

### (අ) ගල් පිපිරවීම / කැණීම් කාර්යයන් සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම

(1) ගල් පිපිරවීම / කැණීම් කාර්යයන් සඳහා උපයෝගී කරගනු ලබන්නේ ගල්වෙඩි බෙහෙත්, ආරක්ෂිත සේවා නූල්, වෝටර් ජෙල්, ඩෙටොනේටර්ස්, ඇමෝනියම් නයිට්‍රේට්, ඩෙටොනේටින් කෝඩ් හා ඉමල්ෂන් පුපුරන ද්‍රව්‍ය යන පුපුරන ද්‍රව්‍ය වේ. ගල් පිපිරවීම / කැණීම් කාර්යයන් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පතක්ම පුපුරන ද්‍රව්‍ය පනතේ සඳහන් (ඇ) ආකෘතියට අනුකූල විය යුතුය. අයදුම්පත ලැබී දින 05 ක් ඇතුළත අයදුම්කරුගේ චරිතය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම සඳහා 2 ආකෘතිය මගින් අයදුම්කරු පදිංචි ස්ථානයට ආසන්නතම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු, සංස්ථා හා වෙනත් රාජ්‍ය ආයතන වල නිලධාරීන් සම්බන්ධයෙන් පොලිස් වාර්තාව කැඳවීම අනවශ්‍යය. පොලිස් වාර්තාවට අනුව අයදුම්කරුට පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍රයක් ලබාදීමට නිර්දේශ කර තිබේ නම් පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුට උපදෙස් දිය යුතුය.

(i) ගල් කැඩීම සිදු කරන ඉඩමේ අයිතිය තහවුරු කිරීම පිළිබඳව ග්‍රාම නිලධාරි සමඟ ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව (1 'අ' ආකෘතිය)

(ii) ගල් පිපිරවීම / කැණීම් කරන ස්ථානය පිළිබඳ සවිස්තර වාර්තාව (3 ආකෘතිය)

(iii) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබාගත් කැණීම් බලපත්‍රය හා පසුගිය කැණීම් බලපත්‍රයට අදාලව ගල්වල හිමියා විසින් කඩන ලද බවට ගණනය කරන ලද ගල් කියුබ් සංඛ්‍යාව (Estimated rock volume ) පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ලබා දෙන තාක්ෂණික වාර්තාව

(iv) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍රය හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

(2) සියලුම ව්‍යාපෘතීන් සඳහා කොන්ත්‍රාත් ලබාගෙන ඇති ආයතන හෝ පුද්ගලයන් විසින් එම කාර්යයට අදාල කැනීම් සඳහා පුපුරන ද්‍රව්‍ය අයදුම් කිරීමේදී එම කොන්ත්‍රාත්තුව තමා වෙත ලැබී ඇති බව තහවුරු කරන ලද සියලුම ලියකියවිලි හා ව්‍යාපෘතියට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණයන් පිළිබඳව සකස් කළ ඇස්තමේන්තු ඇතුළත් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ ව්‍යාපෘති අධ්‍යක්ෂගේ නිර්දේශය (ව්‍යාපෘති අධ්‍යක්ෂ එම ව්‍යාපෘතිය අයත් රාජ්‍ය ආයතනයක විධායක නිලධාරියෙක් විය යුතුය. උදාහරණ වශයෙන් මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යනාදිය වේ.) තවද ව්‍යාපෘතියේ කැණීම් පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ලබා ගන්නා ලද බලපත්‍රය හෝ විශේෂ අවසරය හා අයදුම්කරු විදේශිකයෙක් නම් පොලිස් වාර්තාව වෙනුවට සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ එම පුද්ගලයාගේ විදේශ ගමන් බලපත්‍රයේ සහ වීසා සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය.

(3) ව්‍යාපාරයක් වශයෙන් නොවන ගෙපලක් සකස් කිරීම, ළිං කැණීම, වෙනත් සංවර්ධන ක්‍රියාවලියකට අදාල වන සුළු පරිමාණයේ පිපිරවීම් හා ඉඩමක වගා කිරීමට සකස් කිරීම් ආදි කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් වාර්තාව පමණක් ප්‍රමාණවත් වේ. පිපුරුම් පරීක්ෂණයක් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබා දෙන ලිපිය පමණක් ප්‍රමාණවත් වේ.

(4) ඉහත සඳහන් සියලුම වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් තත් අයදුම්පත්‍රය පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් කර අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව (12 'අ' ආකෘතිය) හා පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා තමන් පදිංචි නිවසේ හෝ ගල් කඩන ස්ථානයේ ආරක්ෂිතව කොන්ක්‍රීට්/ ගඩොලින්/ අහල් ¼ ඝනකමින් යුත් වානේ තහඩුවෙන් තැනූ ගබඩාවක් ඉදි කිරීමට අයදුම්කරුට උපදෙස් දිය යුතුය. පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම් සැලකිල්ලට ගෙන අදාල ගල් කැඩීම සඳහා ලබා දිය යුතු පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් ඔබ වෙත වැඩ කරන දින 07 ක් ඇතුළත නිර්දේශය (12 'ආ' ආකෘතිය) මගින් ඉදිරිපත් කළ යුතුය. තවද ඔහු විසින් අවසරපත්‍රයේ ඇතුළත් කළ යුතු යම් විශේෂ කොන්දේසි ඇත්නම් ඒවාද පුපුරන ද්‍රව්‍ය පතත යටතේ තබාගත යුතු වාර්තා පිළිබඳව ද එම අවසරපත්‍රයේ වලංගු කාල සීමාවද සඳහන් කළ යුතුය.

(5) පුපුරන ද්‍රව්‍ය අවසරපත් නිකුත් කිරීමේදී සිදුවිමට ඉඩ ඇති ප්‍රමාදය සැලකිල්ලට ගෙන ඉහත සඳහන් වාර්තා නිවැරදි මෙන්ම සම්පූර්ණ වේ නම් හා පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය පහත සඳහන් ප්‍රමාණයන් ඉක්ම නොවන්නේ නම් පිපුරුම් පරීක්ෂණයකට හෝ ව්‍යාපාරයක් වශයෙන් නොවන ගෙපළක් සකස් කිරීම, ළිං කැණීම, වෙනත් සංවර්ධන ක්‍රියාවලියකට අදාල වන සුළු පරිමාණයේ පිපිරවීම් හා ඉඩමක වගා කිරීමට සකස් කිරීම් ආදි කටයුතු සඳහා පමණක් ලැබෙන අයදුම්පතක් සඳහා අවසරපත්‍රයක් එම කාර්යය වෙනුවෙන් එක් වරක් පමණක් මාගේ ආවරණ අනුමැතියට යටත්ව මාස දෙකක උපරිම කාලයක් සඳහා නිකුත් කිරීමට මෙයින් ඔබට බලය දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| ගල්වෙඩි බෙහෙත් | කි. ග්‍රෑම් | 03 | ( තුනයි ) |
| ආරක්ෂිත සේවා නූල් | මීටර් | 400 | ( හාර සීයයි ) |
| වෝටර් ජෙල් | කි. ග්‍රෑම් | 10 | ( දහයයි ) |
| ඩෙටොනේටර්ස් | අංක | 200 | ( දෙ සීයයි) |
| ඇමෝනියම් නයිට්‍රේට් | කි. ග්‍රෑම් | 100 | ( එක සීයයි ) |

(6) මාගේ ආවරණ අනුමැතියට යටත්ව නිකුත් කරන ලද අවසරපත්‍රයට අදාල අයදුම්පත සමඟ සියලුම වාර්තා/ බලපත්‍රවල සහතික කළ ඡායා පිටපත් පමණක් ( දිස්ත්‍රික් ලේකම් හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ යුතුය.) අවසරපත්‍රය නිකුත් කළ දින සිට දින 07 ක් ඇතුළත මාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. එම අවසරපත්‍රයේ අංකය හා නිකුත් කළ දිනය, ඔබගේ නිර්දේශයේ ( 4 ආකෘතිය ) සඳහන් කර එවිය යුතුය.

(7) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක හා ඔබ විසින් නිර්දේශ කරනු ලබන පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය ආවරණ අනුමැතියට යටත්ව නිකුත් කළ නොහැකි නම් එම අයදුම්පත සමඟ අවශ්‍ය කරන සියලුම ලියකියවිලි වල සහතික කළ ඡායා පිටපත් පමණක් ( දිස්ත්‍රික් ලේකම් හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ යුතුය.) හා බලපත්‍ර අධිකාරිගේ ස්වකීය නිර්දේශය ( 4 ආකෘතිය ) මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර අවසරපත්‍රය නිකුත් කිරීමේ ලිපිය පමණක් ඔබ වෙත ආපසු එවනු ලැබේ. නිකුත් කරනු ලබන සෑම අවසරපත්‍රයකට මාගේ බලය දීමේ යොමු අංකය සඳහන් කළ යුතුය.

(8) පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍රයක් ඔබ විසින් නිකුත් කර පසු එහි පිටපතක් ඒ බව පහත ආයතන වෙත යොමු කළ යුතුය.

(i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

(ii) ඉඩම් කලමණාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනය

(iii) පරිසර අධිකාරිය

(iv) කැණීම් ස්ථානය පිහිටි පොලිස් ස්ථානය

## (ආ) ගල් පිපිරවීම් / කැණීම් නොවන කාර්යයන් සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම

(1) ගල් පිපිරවීම් / කැණීම් කාර්යයන් සඳහා උපයෝගී කරගනු ලබන පුපුරන ද්‍රව්‍ය හැර 2016.08.25 වන දින අංක 1981/83, 2001.02.16 වන දින අංක 1171/27 හා 2000.05.24 වන දින අංක 1133/13 දරණ අති විශේෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත 1979 පෙබරවාරි මස 13 වන දින අංක 23/5 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1979 පුපුරන ද්‍රව්‍ය නියෝග වල සඳහන් පුපුරන ද්‍රව්‍යයක් ලෙස ප්‍රකාශිත රසායනික ද්‍රව්‍ය සඳහාවූ අවසරපත්‍ර මෙයට ඇතුළත් වේ.

(2) ඔබේ අභිමතය පරිදි අයදුම්කරුවෙකුට සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් මාසිකව නිර්දේශිත ප්‍රමාණය පොටෑසියම් නයිට්‍රේට් (පොදුවේ වෙඩි ලුණු වශයෙන් හැඳින්වෙන) කිලෝ ග්‍රෑම් 05 ක ප්‍රමාණයක් ඉක්ම නොවන්නේ නම් එවැනි අයදුම්පතක් (ඇ ආකෘතිය) සඳහා අවසරපත්‍රයක් මාගේ ආවරණ අනුමැතියට යටත්ව නිකුත් කිරීමට මෙයින් ඔබට බලය දෙනු ලැබේ. අවසරපත්‍රය නිකුත් කළ දින සිට දින 07 ක් ඇතුළත මාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. එම අවසරපත්‍රයේ අංකය හා නිකුත් කළ දිනය, ඔබගේ නිර්දේශයේ ( 4 ආකෘතියට අනුකූලව සකස් කළ ) සඳහන් කර එවිය යුතුය. මාසිකව කිලෝ ග්‍රෑම් 05 කට වැඩි ප්‍රමාණයක් සඳහා වන අයදුම්පත් සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය සමඟ අවශ්‍ය කරන සියලුම ලියකියවිලි වල සහතික කළ ඡායා පිටපත් පමණක් ( දිස්ත්‍රික් ලේකම් හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ යුතුය.) හා බලපත්‍ර අධිකාරිගේ ස්වකීය නිර්දේශය ( 4 ආකෘතිය ) මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර අවසරපත්‍රය නිකුත් කිරීමේ ලිපිය පමණක් ඔබ වෙත ආපසු එවනු ලැබේ. නිකුත් කරනු ලබන සෑම අවසරපත්‍රයකට මාගේ බලය දීමේ යොමු අංකය සඳහන් කළ යුතුය.

(3) දේශිය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය වන ආසනික් සල්පයිඩ් (මනෝසිල), ඇන්ටිමනි සල්පයිඩ් (රන් හිරියල්), මර්කරි සල්පයිඩ් (සාදිලිංගම්), ලෙඩ් සල්පයිඩ් (අංජන කැට) හා පොටෑසියම් නයිට්‍රේට් (වෙඩි ලුණු) සඳහා අවසරපත්‍ර අයදුම් කිරීමේදී අයදුම්කරු ලියාපදිංචි දේශිය ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස තම අනන්‍යතාවය තහවුරු කළාට පසු ඔබේ අභිමතය පරිදි එක් එක් රසායනික ද්‍රව්‍යවලින් ග්‍රෑම් 500 ක ප්‍රමාණයක් නොඉක්මවන්නේ නම් එවැනි අයදුම්පතක් (ඇ ආකෘතිය) සඳහා අවසරපත්‍රයක් මාගේ ආවරණ අනුමැතියට යටත්ව නිකුත් කිරීමට මෙයින් ඔබට බලය දෙනු ලැබේ. අවසරපත්‍රය නිකුත් කළ දින සිට දින 07 ක් ඇතුළත මාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. එම අවසරපත්‍රයේ අංකය හා නිකුත් කළ දිනය, ඔබගේ නිර්දේශයේ ( 4 ආකෘතියට අනුකූලව සකස් කළ ) සඳහන් කර එවිය යුතුය.

(4) ගිනිකූරු නිෂ්පාදන කර්මාන්තකරුවන්ට අවශ්‍ය පොටෑසියම් ක්ලෝරේට් (පොටෑස්) හා රතු පොස්පරස් සඳහා අවසරපත්‍ර නිකුත් කළ යුත්තේ මාගේ පූර්ව අනුමැතිය ඇතිව පමණි. ඒ සඳහා පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුට උපදෙස් දිය යුතුය.

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (ඇ ආකෘතිය)
(ii) අයදුම්කරුගේ චරිතය පිළිබඳ පොලිස් වාර්තාව ( 2 ආකෘතිය )
(iii) මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය
(iv) කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරික්ෂක ඉංජිනේරුගේ අනුමැතිය
(v) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය (1 'ආ' ආකෘතිය)
(vi) නිෂ්පාදිත ගිනිපෙට්ටි සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබාගත් ප්‍රමිති සහතිකය
(vii) සේවක අර්ථසාධක මුදල් ගෙවන සේවක සංඛ්‍යාව හා සේවක අර්ථසාධක අරමුදලේ ලිපිගොනු අංකය සනාථ කරන ලියකියවිලි වල සත්‍ය පිටපතක් බව සහතික කළ ඡායා පිටපත්
(viii) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය
(ix) පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට් පත
(x) පසුගිය අවසර පත්‍රය යටතේ ලබාගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, භාවිතා කළ ප්‍රමාණය, ඉතිරි ප්‍රමාණය, නිෂ්පාදනය කළ ගිනිපෙට්ටි ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය පිළිබඳ වාර්තාව
(xi) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

ඉහත සඳහන් සියලුම වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් තත් අයදුම්පත්‍රය පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් කර ඔබ වෙත සති 03 ක් ඇතුළත නිර්දේශය (12 'ඇ' ආකෘතිය) මගින් ඉදිරිපත් කළ යුතුය. තවද ඔහු විසින් අවසරපත්‍රයේ ඇතුළත් කළ යුතු යම් විශේෂ කොන්දේසි ඇත්නම් ඒවාද පුපුරන ද්‍රව්‍ය පනත යටතේ තබාගත යුතු වාර්තා පිළිබඳව ද එම අවසරපත්‍රයේ වලංගු කාල සීමාවද සඳහන් කළ යුතුය. එම අයදුම්පත සමඟ අවශ්‍ය කරන සියලුම ලියකියවිලි වල <u>සහතික කළ ඡායා පිටපත් පමණක්</u> ( දිස්ත්‍රික් ලේකම් හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ යුතුය.) හා

බලපත්‍ර අධිකාරිගේ ස්වකීය නිර්දේශය ( 4 ආකෘතිය ) මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර අවසරපත්‍රය නිකුත් කිරීමේ ලිපිය පමණක් ඔබ වෙත ආපසු එවනු ලැබේ. නිකුත් කරනු ලබන සෑම අවසරපත්‍රයකට මාගේ බලය දීමේ යොමු අංකය සඳහන් කළ යුතුය.

## 05. පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර වල වලංගු කාලය

අවසර පත්‍රයක උපරිම වලංගු කාලය මාස 06 කට පමණක් සීමා කළ යුතුය. අවසරපත්‍රයක වලංගු කාලය කුමන හේතුවක් නිසාවත් දීර්ඝ නොකළ යුතුය.

## 06. පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර ලාභීන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම

### (අ) ගල්වල හිමියන් හා ව්‍යාපෘතීන් සඳහා පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම

පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර ලාභීන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීමට පෙර අවසරපත්‍ර ලාභීන් විසින් පහත සඳහන් ලියකියවිලි සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියකියවිලි වල සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ ඡායා පිටපත් මා වෙත ද එවිය යුතුය. පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර ලාභීන් වෙනුවෙන් ඔවුන්ගේ අනු නියෝජිතයන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීමේදී එම අනුනියෝජිතයාගේ අනන්‍යතා පත්‍රය, (14 ආකෘතිය) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙත ඉදිරිපත් කර යුතුය. එම අනන්‍යතා පත්‍රයේද සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ ඡායා පිටපතක් මා වෙත ද එවිය යුතුය.

a. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබාගත් කැනීම් බලපත්‍රයට අනුකූලව මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ එහි දිස්ත්‍රික් කාර්යාලයෙන් හෝ ගල් කැඩීම සිදු කරන ස්ථානය අයත් පළාත සඳහා පළාත් පරිසර අධිකාරියක් පිහිටුවා ඇත්නම් එම පළාත් පරිසර අධිකාරියෙන් හෝ ගල් කැඩීම සිදු කරන ස්ථානය අයත් පළාත් පාලන ආයතනයෙන් ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

b. ගල් කැඩීම සිදු කරන ස්ථානය අයත් පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට් පත

(1) ගල්වල හිමියන් හා සියලුම ව්‍යාපෘතිකරුවන් සඳහා පුපුරන ද්‍රව්‍ය නිකුත් කළ යුත්තේ ඔබගේ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසිනි. ගල්වල හිමියන් හා ව්‍යාපෘතිකරුවන් විසින් පවත්වා ගෙනු ලබන දෛනිකව පුපුරන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලේඛනය (13 'අ' ආකෘතිය) ආකාරයට සකසා ගත යුතුය. ගල්වල හිමියන් හා ව්‍යාපෘතිකරුවන් විසින් අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම, පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රය සමඟ පුපුරන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලේඛනයද (13 'අ' ආකෘතිය) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙත ඉදිරිපත් කළ යුතුය. එම ලේඛනය හා අවසර පත්‍රය අධීක්ෂණය කළ දැනට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය වර්ග හා ප්‍රමාණ

දිස්ත්‍රික්කයේ නම් කරනු ලබන බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නකුගෙන් ලබා ගැනීමට සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් අවසරපත්‍ර ලාභියා වෙත අනුමැති ලිපිය (7 'අ' ආකෘතිය) ලබා දිය යුතුය.

(2) නමුත් මහා පරිමාණ රජයේ හා පෞද්ගලික ව්‍යාපෘතීන් සඳහා පුපුරන ද්‍රව්‍ය අවශ්‍යතාවය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මා වෙත ඉල්ලුම් කළ පසු දිස්ත්‍රික්කයේ කුමන ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාගෙන් ලබා ගත්තේද යන්න මා විසින් අදාල දිස්ත්‍රික්කයේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක හා ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(3) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් අනුමැතිය ලබා දුන් ප්‍රමාණය පමණක් අවසරපත්‍ර ලාභියා වෙත නිකුත් කර අවසරපත්‍රයේ පසුපිට බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් පිටසන් කළ යුතුය. දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවේ නිකුත් කිරීම භාර පොලිස් නිලධාරියා (1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය ආඥාපනතේ 3 (2) වගන්තිය ප්‍රකාරව සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියෙක් විය යුතුය.) එම පිටසන පරීක්ෂා කළ අවසරපත්‍රයේ පිටසන් කළ ස්ථානයේ ඔහු විසින් අත්සන් කළ යුතුය.

(4) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් අවසරපත්‍ර ලාභියා වෙත ලබා දුන් අනුමැති ලිපියේ මුල් පිටපත (7 'අ' ආකෘතිය) බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් සුරක්ෂිතව ළඟ තබා ගත යුතුය. එම ලිපිය ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට ඔහුගේ වගකීම වේ. බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් පවත්වා ගෙනු ලබන තොග පොත ( 9 ආකෘතිය ) ආකාරයට සකසා ගත යුතුය. අවසරපත්‍ර ලාභියා වෙත නිකුත් කළ පුපුරන ද්‍රව්‍ය වර්ග හා ප්‍රමාණ, විශේෂයෙන්ම එක් එක් අවසර පත්‍ර ලාභියාට නිකුත් කරන ලද වෝටර් ජෙල් කරල්වල අංක පැහැදිලිව බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාගේ තොග පොතේ සඳහන් කර තිබිය යුතුය. නමුත් වෝටර් ජෙල් කරල් සඳහා එක් එක් අංක සටහන් කිරීමට තොග පොතේ ඉඩකඩ නොමැති නිසා එම අංක සටහන් කිරීම සඳහා වෙනම සී. ආර්. පොතක් බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් සකස් කරගත යුතුය. තවද එම පොතේ අදාල අංක සහිත වෝටර් ජෙල් කරල් ලබා ගත් බවට අවසරපත්‍ර ලාභියාගේ අත්සන අනිවාර්යයෙන්ම තිබිය යුතුය. ඕනෑම අවස්ථාවකදී නම් කරන ලද අංකයකට අදාල වෝටර් ජෙල් කරල ලබා දුන්නේ කාටද යන්න තොග පොතට අනුව බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා දැන ගෙන සිටීම ඔහුගේ වගකීම වේ. බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් කිසිම පුපුරන ද්‍රව්‍යයක් හුවමාරු කිරීම නොකළ යුතුය. තවද ගබඩාවේ එක් යතුරක් මුරපොලේ පොලිස් ස්ථානාධිපති ( 1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය ආඥාපනතේ 3 (2) වගන්තියට අනුව සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියෙක් විය යුතුය.) වෙතද අනෙක් යතුර බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා ළඟ තබා ගත යුතුය. හදිසි අවස්ථාවකදී ගබඩාව විවෘත කිරීම සඳහා බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා ළඟ තිබෙන යතුර මිනිත්තු 15ක් ඇතුළත මුරපොලේ පොලිස් ස්ථානාධිපතිවරයාට ලැබීමට සැලැස්විය යුතුය.

(5) ඔබ දිස්ත්‍රික්කය තුළ මහා පරිමාණයෙන් සිදු කරනු ලබන ජාතික මට්ටමේ රජයට අනුබද්ධිත ව්‍යාපෘති වල විශේෂ අවශ්‍යතා සඳහා අවශ්‍ය වන්නා වූ පුපුරන ද්‍රව්‍ය, දෙපාර්තමේන්තු ගාස්තු, රේගු, වැට් හා වෙනත් බදු වලට යටත්ව පිටරටින් ආනයනය කිරීමට වැලිසර නාවික හමුදා CEFAP ඒකකය මගින් සිදු කර යුතු ය. පිටරටින් ආනයනය කර යුතු පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය හා ඒවායේ වර්ගයන් පිළිබඳව තීරණය කිරීම සඳහා එම ව්‍යාපෘතිය අයත් අමාත්‍යාංශයේ ලේකම් හෝ ව්‍යාපෘති අධ්‍යක්ෂ මගින් සවිස්තර වාර්තාවක්, සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය ඇතිව ඔබගේ නිර්දේශය ද මා වෙත ඉදිරිපත් කළ යුතුය. ආනයනය කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර එය ගෙන්වා දීමට වැලිසර නාවික හමුදා CEFAP ඒකකය වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත.

## (ආ) <u>ගිනිකූරු නිෂ්පාදන කර්මාන්තකරුවන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම</u>

ගිනිකූරු නිෂ්පාදන කර්මාන්තකරුවන්ට අවශ්‍ය පොටෑසියම් ක්ලෝරේට් (පොටෑස්) හා රතු පොස්පරස් නිකුත් කර යුත්තේ වැලිසර නාවික හමුදා CEFAP ඒකකයෙන් පමණි. ගිනිකූරු නිෂ්පාදන කර්මාන්තකරු විසින් අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය ලබා දෙන ලෙස සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙත කරනු ලබන ඉල්ලීම ( 6 'අ' ආකෘතිය) සමඟ පුපුරන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලේඛනය ද අවසානයේදී ලබාගත් වාරිකය සඳහා නිෂ්පාදනය කළ ගිනිපෙට්ටි ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාව අධීක්ෂණය කළ දැනට අවශ්‍ය ප්‍රමාණය පිළිබඳ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර ඒ බව වැලිසර නාවික හමුදා CEFAP ඒකකයට හා ගිනිකූරු නිෂ්පාදන කර්මාන්තකරුට දැනුම් දෙනු ලැබේ.

## (ඇ) <u>දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවෙන් පුපුරන ද්‍රව්‍ය නිකුත් කරන දින තීරණය කිරීම</u>

ඔබගේ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුපුරන ද්‍රව්‍ය ගබඩා සංකීර්ණයෙන් බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් <u>රජයේ කාර්යාල දිනයන්හිදී පමණක්</u> පුපුරන ද්‍රව්‍ය නිකුත් කර හැකිය. තවද පෙර වරු 7.00 සිට පස් වරු 4.30 දක්වා පමණක් පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම සිදු කළ යුතුය. පස් වරු 4.30 න් පසු එක් එක් බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් සිදු කරන ලද නිකුත් කිරීම ඔහුගේ තොග පොතේ ලේඛනගත කර ගබඩාවේ ඉතිරිය භෞතිකව ගබඩා භාර පොලිස් නිලධාරියා ( 1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය ආඥපනතේ 3 (2) වගන්තියට අනුව සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියෙක් විය යුතුය.) විසින් පරීක්ෂා කර ලොග් පොතේ සටහන් කළ යුතුය. සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් එම නිකුත් කිරීම, ඉතිරි ප්‍රමාණය හා විශේෂයෙන්ම එක් එක් අවසර පත්‍ර ලාභියාට නිකුත් කරන ලද වෝටර් ජෙල් කරල්වල අංක පැහැදිලිව බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාගේ තොග පොතේ සඳහන් කර තිබේදැයි පරීක්ෂා කර ඒ පිළිබඳව මාසික වාර්තාව ( 11 ආකෘතිය ආකාරයට සකස් කළ ) ඊළඟ මාසයේ 05 වන දිනට පෙර මා වෙත එවිය යුතුය.

(ඇ) <u>අනවසර පුපුරන ද්‍රව්‍ය භාවිතයන් පිළිබඳ වැටලීම්</u>

ස්ථානීය පරීක්ෂණ , වැටලීම් කිරීම සඳහා විශේෂ ආරක්ෂක අනුඛණ්ඩයක් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගේ යටතේ ස්ථාපිත කර යුතුය. එම විශේෂ අනුඛණ්ඩය මගින් දිස්ත්‍රික්කයේ විවිධ ප්‍රදේශ වල අහඹු වැටලීම් සිදු කළ යුතුය. අවශ්‍ය අවස්ථා වල දී අනවසර පුපුරන ද්‍රව්‍ය භාවිතයන් පිළිබඳ දැනුම් දීමට සහ අවශ්‍ය සහය ලබා දීමට ඔබ විසින් එම විශේෂ අනුඛණ්ඩය සම්බන්ධ කර ගත යුතුය.

## 07. <u>පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ප්‍රවාහන අවසර පත්‍ර නිකුත් කිරීම</u>

(අ) <u>ගල්වල හිමියන් හා ව්‍යාපෘතීන් සඳහා</u>

ගල්වල හිමියන් හා සියලුම ව්‍යාපෘතිකරුවන් සඳහා පුපුරන ද්‍රව්‍ය නිකුත් කළ යුත්තේ ඔබගේ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසිනි. ඒ සඳහා පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන අවසර පත්‍රය එසේ ප්‍රවාහනය කිරීම පටන් ගන්නා ස්ථානය වන දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාව භාර පොලිස් නිලධාරියා ( 1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය ආඥපනතේ 3 (2) වගන්තියට අනුව සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියෙක් විය යුතුය.) විසින් නිකුත් කළ යුතුය.

(ආ) <u>දිස්ත්‍රික් බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් සඳහා</u>

ඔබගේ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් සඳහා පුපුරන ද්‍රව්‍ය නිකුත් කර යුත්තේ වැලිසර නාවික හමුදා CEFAP ඒකකය හා සී/ස ශ්‍රී ලංකා රජයේ (විවිධ) නීතිගත සංස්ථාව විසිනි. පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන අවසරපත්‍රය එසේ ප්‍රවාහනය කිරීම පටන් ගන්නා ස්ථානයට ආසන්නතම පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපති විසින් නිකුත් කළ යුතුය. ඒ සඳහා පාවිච්චි කරන වාහනවල යෝග්‍යතා සහතික නිකුත් කර යුත්තේ ඔබගේ දිස්ත්‍රික්කයේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසිනි. (8 'අ' ආකෘතිය) ප්‍රවාහනය අවසන්වූ පසු වහාම පුපුරන ද්‍රව්‍ය ගබඩාව භාර පොලිස් නිලධාරියා විසින් නිසියාකාරව පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කළ ඇති බවට සටහනක් ප්‍රවාහන අවසරපත්‍රය මත තබා නිල මුද්‍රාව සහිත අත්සනින් ඒ බව සනාථ කළ යුතුය. එම ප්‍රවාහන අවසර පත්‍රය බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් සුරක්ෂිතව ළඟ තබා ගත යුතුය. එම ප්‍රවාහන අවසරපත්‍රය ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට ඔහුගේ වගකීම වේ. ප්‍රවාහනයට අවශ්‍ය පොලිස් ආරක්ෂාව අදාල කොට්ඨාශයේ පොලිස් අධිකාරි හරහා ලබා ගත යුතුය. මෝටර් රථ පරීක්ෂක හා සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් පරීක්ෂා කළ සහතික කරන ලද වාහනවලට පමණක් පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා අවසර ලබා දිය යුතුය. (8 'ආ' ආකෘතිය) අවසර ලබා දෙන වාහන වාර්ෂිකව මෝටර් රථ පරීක්ෂක හා සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් පරීක්ෂා කළ යුතුය.

(i) බලපත්‍රලාභී ගුල් වෙඩි බෙහෙත්, ආරක්ෂිත සේවා නූල් නිෂ්පාදකයන්ගෙන් හා බලපත්‍රලාභී බේරියම් නයිට්‍රේට්, පොටෑසියම් පර් ක්ලෝරේට් ආනයනකරුවන්ගෙන් පුපුරන ද්‍රව්‍ය මිල දී ගෙන ප්‍රවාහනය

කිරීම සඳහා ප්‍රවාහන අවසරපත්‍රය, බලපත්‍රලාභී ගල් වෙඩි බෙහෙත්, ආරක්ෂිත සේවා නූල් නිෂ්පාදකයන්ගේ හා බලපත්‍රලාභී බේරියම් නයිට්‍රේට්, පොටෑසියම් පර් ක්ලෝරේට් ආනයනකරුවන්ගේ ගබඩා පිහිටා ඇති ස්ථානයට ආසන්නතම පොලිසියේ පොලිස් ස්ථානාධිපති හෝ දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාව භාර පොලිස් නිලධාරියා ( 1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය ආඥපනතේ 3 (2) වගන්තියට අනුව සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියෙක් විය යුතුය.) විසින් නිකුත් කළ යුතුය. ඒ සඳහා පාවිච්චි කරන වාහනවල යෝග්‍යතා සහතික නිකුත් කර යුත්තේ ඔබගේ දිස්ත්‍රික්කයේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසිනි. (8 'අ' ආකෘතිය) ප්‍රවාහනයට අවශ්‍ය පොලිස් ආරක්ෂාව අදාල කොට්ඨාශයේ පොලිස් අධිකාරි හරහා ලබා ගත යුතුය.

(ඇ) <u>ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන් සඳහා</u>

ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කළ යුත්තේ ඔබගේ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාගෙන් පමණි. ඒ සඳහා පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන අවසර පත්‍රය එසේ ප්‍රවාහනය කිරීම පටන් ගන්නා ස්ථානය වන දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාව භාර පොලිස් නිලධාරියා ( 1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය ආඥපනතේ 3 (2) වගන්තියට අනුව සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියෙක් විය යුතුය.) විසින් නිකුත් කළ යුතුය.

## 08. <u>පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර ලාභීන්ට / ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන්ට සන්තකයේ තබාගත හැකි පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණ</u>

(අ) පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍රලාභීන් විසින් පහත සඳහන් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය නොඉක්මවන්නේ නම් දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවේ සිට පොලිස් ආරක්ෂාව නොමැතිව ප්‍රවාහනය කිරීමට සහ තමන් පදිංචි නිවසේ හෝ ගල් කඩන ස්ථානයේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් ලබා දෙන උපදෙස් අනුව ගොඩනැඟූ ආරක්ෂිතව කොන්ක්‍රීට්/ ගඩොලින්/ අඟල් ¼ ඝනකමින් යුත් වානේ තහඩුවෙන් තැනූ ගබඩාවක තබා ගැනීමට හා තමන් පදිංචි නිවසේ ගබඩා කර ඇති පුපුරන ද්‍රව්‍ය ගල්වල වෙත පොලිස් ආරක්ෂාව නොමැතිව ප්‍රවාහනය කිරීමට අවසර දෙනු ලැබේ. එසේ වුවද ඩෙටොනේටර්ස් වෙනම ගබඩා කළ තැබිය යුතුය.

| | | | |
|---|---|---|---|
| ගල්වෙඩි බෙහෙත් | කි. ග්‍රෑම් | 03 | ( තුනයි ) |
| ආරක්ෂිත සේවා නූල් | මීටර් | 600 | ( හයසීයයි ) |
| වෝටර් ජෙල් | කි. ග්‍රෑම් | 15 | (පහළොවයි ) |
| ඩෙටොනේටර්ස් | අංක | 250 | ( දෙසීය පනහයි) |
| ඇමෝනියම් නයිට්‍රේට් | කි. ග්‍රෑම් | 250 | (දෙසීය පනහයි ) |

(ආ) ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන්ට පොටෑසියම් නයිට්‍රේට්, බේරියම් නයිට්‍රේට් හා පොටෑසියම් පර් ක්ලෝරේට් යන පුපුරන ද්‍රව්‍ය වර්ග නිකුත් කරනු ලැබේ. මෙම පුපුරන

ද්‍රව්‍ය වර්ග තුනේම නිකුත් කළ ප්‍රමාණවල එකතුව කිලෝ ග්‍රෑම් 500 (පන් සියයි) ඉක්ම නොවන්නේ නම් දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවේ සිට පොලිස් ආරක්ෂාව නොමැතිව ප්‍රවාහනය කිරීමට සහ නිෂ්පාදන ස්ථානයේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් ලබා දෙන උපදෙස් අනුව ගොඩනැඟු ආරක්ෂිතව කොන්ක්‍රීට්/ ගඩොලින්/ අඟල් ¼ ඝනකමින් යුත් වානේ තහඩුවෙන් තැනූ ගබඩාවක තබා ගැනීමට අවසර දෙනු ලැබේ.

(ඇ) ව්‍යාපෘතීන් හා ගල්වලවල් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන කාර්මික කැණීම් (ඒ) කාණ්ඩය බලපත්‍ර ලාභීන් වෙත නිකුත් කරන ලද පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර සඳහා පහත සඳහන් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය නොඉක්මවන්නේ නම් දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවේ සිට පොලිස් ආරක්ෂාව නොමැතිව ප්‍රවාහනය කිරීමට සහ තමන් පදිංචි නිවසේ හෝ ගල් කඩන ස්ථානයේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් ලබා දෙන උපදෙස් අනුව ගොඩනැඟු ආරක්ෂිතව කොන්ක්‍රීට්/ ගඩොලින්/ අඟල් ¼ ඝනකමින් යුත් වානේ තහඩුවෙන් තැනූ ගබඩාවක තබා ගැනීමට හා තමන් පදිංචි නිවසේ ගබඩා කර ඇති පුපුරන ද්‍රව්‍ය, ව්‍යාපෘති භූමියට / ගල්වල වෙත පොලිස් ආරක්ෂාව නොමැතිව ප්‍රවාහනය කිරීමට අවසර දෙනු ලැබේ. එසේ වුවද ඩෙටොනේටර්ස් වෙනම ගබඩා කළ තැබිය යුතුය.

| | | | |
|---|---|---|---|
| වෝටර් ජෙල් | කි. ග්‍රෑම් | 25 | ( විසිපහයි ) |
| ඩෙටොනේටර්ස් | අංක | 500 | ( පන් සියයි) |
| ඇමෝනියම් නයිට්‍රේට් | කි. ග්‍රෑම් | 500 | ( පන් සියයි ) |

## 09. ඉකුත් වූ පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර

අවසරපත්‍ර ලාභියා විසින් ස්වකීය අවසරපත්‍රය අවසන් වූ දිනයේ සිට සතියක් ඇතුළත එම අවසරපත්‍රය සමඟ ඉතිරිව ඇති පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණ බලපත්‍ර අධිකාරි වෙත ආපසු භාර දිය යුතුය. අවසරපත්‍ර ලාභීන්ගෙන් කීප දෙනෙක් පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීමට හේතු වූ කාර්යය වෙනුවෙන් අවසර දී ඇති පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණයෙන් කොටසක් පමණක් උපයෝගී කොට එම කාර්යය සපුරාලීමෙන් පසු ඉතිරිව ඇති පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය බලපත්‍ර අධිකාරි වෙත ආපසු භාර නොදීම හේතුවෙන් ඒවා අවභාවිතා කිරීමට ඉඩකඩ ඇත. එම නිසා සෑම අවසරපත්‍ර ලාභියෙකුටම ස්වකීය අවසරපත්‍රය අවසන් වූ දිනයේ සිට දින 07 ක් ඇතුළත එම අවසරපත්‍රය සමඟ ඉතිරිව ඇති පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණ ආපසු ඔබ වෙත භාර දෙන ලෙස උපදෙස් දිය යුතුය.

## 10. පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නැතිවීම

(1) වලංගු අවසර පත්‍රයක් නැතිවූ විගස අවසර පත්‍රලාභියා විසින් නැතිවීම පිළිබඳව බලපත්‍ර අධිකාරි වන දිස්ත්‍රික් ලේකම්/දිසාපති, සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක හා ආසන්නතම පොලිසියේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දිය යුතුය.

(2) නැති වී ඇති අවසර පත්‍රය පිළිබඳව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් ඔබගේ දිස්ත්‍රික්කයේ සියලුම බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් වෙත පහත දැක්වෙන විස්තර සඳහන් කරමින් ඒ බව දැන්විය යුතුය.

(අ) අවසර පත්‍රලාභියාගේ නම

(ආ) අවසර පත්‍රයේ අංකය

(ඇ) පාවිච්චි කිරීමට අවසරලත් පුපුරන ද්‍රව්‍ය හා ප්‍රමාණය

(ඈ) අවසර පත්‍රයේ වලංගු කාල සීමාව හා නිකුත් කළ දිනය

නැති වූ බව දන්වා ඇති අවසර පත්‍රය සඳහා කිසිදු පුපුරන ද්‍රව්‍යයක් සපයන්නන් විසින් නොවිකිණිය යුතු බව ද එබඳු අවසරපත්‍රයක් ඉදිරිපත් කරන යම් පුද්ගලයකු වෙතොත් ඒ පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට වහාම දන්වා සිටිය යුතු බව ද ඔවුනට උපදෙස් දිය යුතුය.

(3) නැති වී ඇති අවසර පත්‍රය සම්බන්ධව බලපත්‍ර අධිකාරි විසින් පූර්ණ පරීක්ෂණයක් පවත්වා, නැතිවීම පිළිබඳව පැමිණිලි කර දින සිට දින 21ක් ඇතුළත ඔබ විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගය ද අලුත් අවසර පත්‍රයක් නිකුත් කර යුත්තේද යන්න පිළිබඳව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ වාර්තාව ද පොලිස් වාර්තාව සමඟ ඔබගේ නිර්දේශ මා වෙත එවිය යුතුය. ඒ අනුව ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳව මා විසින් තීරණය කරනු ඇත.

## 11. <u>පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර අලුත් කිරීම</u>

අවසරපත්‍රලාභියා විසින් අලුත් කිරීම සඳහා ස්වකීය අවසර පත්‍රය <u>අවලංගු වන දින සිට මාසයකට පෙර</u> අයදුම් කළ හැක. ඒ සඳහා වූ පොලිස් වාර්තාව, පොලිස් ස්ථානාධිපති විසින් අත්සන් කර ඇති දිනයේ සිට අවුරුදු 01 ක් සඳහා වලංගු වේ. තවද ප්‍රාදේශීය ලේකම් වාර්තාව, ප්‍රාදේශීය ලේකම් අත්සන් කර ඇති දිනයේ සිට අවුරුදු 01 ක් සඳහා වලංගු වේ. ඒ අනුව 4 වෙනි ඡේදයේ උපදෙස් පරිදි අවසරපත්‍ර ලාභියාට අලුත් අවසරපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

## 12. <u>පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම</u>

(1) පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ

(i) පුපුරන ද්‍රව්‍ය, ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදනය කිරීම

(ii) පුපුරන ද්‍රව්‍ය ආනයනය/අපනයනය කිරීම

(iii) පුපුරන ද්‍රව්‍ය, ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා විකිණීම හෝ සැපයීම

පිණිසය. මේ සඳහා (අ), (ආ), (ආ1) හා (ඇ) වශයෙන් අංකනය කර ඇති ආකෘති පත්‍ර භාවිතා කළ යුතුය. සෑම අයදුම් පතක්ම ලැබී දින පහක් ඇතුළත අයදුම්කරුගේ චරිතය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම සඳහා 2 ආකෘතිය මගින් අයදුම්කරු පදිංචි ස්ථානයට ආසන්නතම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදනය කිරීම, විකිණීම හෝ සැපයීම් සඳහා බලපත්‍ර ලබාගන්නා අයදුම්කරුවන්ගේ පොලිස් වාර්තාව ආසන්නතම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති නිර්දේශ කර තිබීම ප්‍රමාණවත් වේ. <u>පුපුරන ද්‍රව්‍ය විකිණීම සඳහා</u>

ආනයනය කිරීම, පුපුරන ද්‍රව්‍ය විකිණීම හා පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍ර ලබාගන්නා අයදුම්කරුවන්ගේ පොලිස් වාර්තාව පොලිස් අධිකාරී විසින් නිර්දේශ කර තිබිය යුතුය. දෙපාර්තමේන්තු, සංස්ථා හා වෙනත් රාජ්‍ය ආයතන වල නිලධාරීන් සම්බන්ධයෙන් පොලිස් වාර්තාව කැඳවීම අනවශ්‍යය. පොලිස් වාර්තාවට අනුව අයදුම්කරුට පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයක් ලබාදීමට නිර්දේශ කර තිබේ නම් පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුට උපදෙස් දිය යුතුය.

**(2) වෝටර් ජෙල්, එමල්ෂන් පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදකයන්ගෙන් බලපත්‍ර අයදුම් කිරීමේදී පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කර යුතුය.**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (අ ආකෘතිය)

(ii) මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

(iii) කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අනුමැතිය

(iv) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ( 1 ඇ ආකෘතිය)

(v) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය

(vi) පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට් පත

(vii) පළාත් පාලන ආයතනයේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ගිනි නිවීම් සහතිකය ( Fire Clearance Certificate )

(viii) පසුගිය බලපත්‍රය යටතේ ලබාගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, භාවිතා කළ ප්‍රමාණය, ඉතිරි ප්‍රමාණය, නිෂ්පාදනය කළ ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය හා ඉතිරි ප්‍රමාණය පිළිබඳ වාර්තාව

(ix) පසුගිය වසරට ආදායම් බදු ගෙවූ ලියකියවිලි වල සත්‍ය පිටපතක් බව සහතික කළ ඡායා පිටපත්

(x) සේවක අර්ථසාධක මුදල් ගෙවන සේවක සංඛ්‍යාව හා සේවක අර්ථසාධක අරමුදලේ ලිපිගොනු අංකය සනාථ කරන ලියකියවිලි වල සත්‍ය පිටපතක් බව සහතික කළ ඡායා පිටපත්

(xi) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

**(3) ගල් වෙඩි බෙහෙත් හා ආරක්ෂිත සේවා නූල් නිෂ්පාදකයන්ගෙන් බලපත්‍ර අයදුම් කිරීමේදී පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කර යුතුය.**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (අ ආකෘතිය)

(ii) මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

(iii) කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අනුමැතිය

(iv) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ( 1 ඇ ආකෘතිය)

(v) නිෂ්පාදන වල ප්‍රමිතිය පිළිබඳව ලබාගත් රජයේ රස පරීක්ෂක වාර්තාව

(vi) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය

(vii) පසුගිය වසරට ආදායම් බදු ගෙවූ ලියකියවිලි වල සත්‍ය පිටපතක් බව සහතික කළ ඡායා පිටපත්

(viii) පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට් පත

(ix) පළාත් පාලන ආයතනයේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ගිනි නිවීමේ සහතිකය ( Fire Clearance Certificate )

(x) පසුගිය බලපත්‍රය යටතේ ලබාගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, භාවිතා කළ ප්‍රමාණය, ඉතිරි ප්‍රමාණය, නිෂ්පාදනය කළ ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය, විකුණුයේ කාටද හා ඉතිරි ප්‍රමාණය යන්න පිළිබඳ වාර්තාව

(xi) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

**(4) ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදකයන්ගෙන් බලපත්‍ර අයදුම් කිරීමේදී පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කළ යුතුය.**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (අ ආකෘතිය)

(ii) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ( 1 ඇ ආකෘතිය)

(iii) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය

(iv) අළුතින් ආරම්භ කරන කර්මාන්තශාලා සඳහා පමණක් කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අනුමැතිය

(v) පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට් පත

(vi) පසුගිය බලපත්‍රය යටතේ ලබාගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, භාවිතා කළ ප්‍රමාණය, ඉතිරි ප්‍රමාණය, නිෂ්පාදනය කළ ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය හා විකුණුයේ කාටද යන්න පිළිබඳ වාර්තාව

(vii) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

**(5) විකිණීම සඳහා පුපුරන ද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍ර අයදුම් කිරීමේදී පහත සඳහන් වාර්තා ඉදිරිපත් කර යුතුය.**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (ආ ආකෘතිය)

(ii) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය

(iii) පසුගිය වසරට ආදායම් බදු ගෙවූ ලියකියවිලි වල සත්‍ය පිටපතක් බව සහතික කළ ඡායා පිටපත්

(iv) ආනයනය කරනු ලබන පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට අයත් දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවක ගබඩා ඉදිකර ඇති බව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ තිබිය යුතුය.

(v) පසුගිය බලපත්‍රය යටතේ ගෙන්වූ පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය, විකුණුයේ කාටද හා ඉතිරි ප්‍රමාණය පිළිබඳ වාර්තාව

(vi) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

**(6) අත් මේස් (Gloves), තීන්ත (paints) හා වෙනත් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අවශ්‍ය පුපුරන ද්‍රව්‍යයක් ලෙස ප්‍රකාශිත රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍ර අයදුම් කිරීමේදී හා ආනයනය කළ පුපුරන ද්‍රව්‍ය සන්තකයේ තබාගැනීම, පාවිච්චි කිරීම සඳහා අවසර පත්‍රය ලබාගැනීම අයදුම් කිරීමේදී පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කර යුතුය.**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (ආ ආකෘතිය) හා (ඇ ආකෘතිය)

(ii) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය

(iii) පසුගිය වසරට ආදායම් බදු ගෙවූ ලියකියවිලි වල සත්‍ය පිටපතක් බව සහතික කළ ඡායා පිටපත්

(iv) මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

(v) කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කර්මාන්තශාලා ඉංජිනේරුගේ අනුමැතිය

(vi) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ( 1 'ඉ' ආකෘතිය)

(vii) පසුගිය බලපත්‍රය යටතේ ලබාගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, භාවිතා කළ ප්‍රමාණය, ඉතිරි ප්‍රමාණය, නිෂ්පාදනය කළ ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය පිළිබඳ වාර්තාව

(viii) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

**(7) පුපුරන ද්‍රව්‍ය විකිණීම සඳහා පුපුරන ද්‍රව්‍ය සපයන්නා බලපත්‍ර අයදුම් කිරීමේදී පහත සඳහන් වාර්තා ඉදිරිපත් කර යුතුය.**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (ඇ ආකෘතිය)

(ii) පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට අයත් දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවක ගබඩා ඉදිකර ඇති බව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ තිබිය යුතුය.

(iii) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය

(iv) පසුගිය බලපත්‍රය යටතේ ලබාගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය, විකුණූයේ කාටද හා ඉතිරි ප්‍රමාණය පිළිබඳ වාර්තාව

(v) පසුගිය වසරට ආදායම් බදු ගෙවූ ලියකියවිලි වල සත්‍ය පිටපතක් බව සහතික කළ ඡායා පිටපත්

(ix) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

**(8) ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා විකිණීම හෝ සැපයීම සඳහා පුපුරන ද්‍රව්‍ය සපයන්නා බලපත්‍ර අයදුම් කිරීමේදී පහත සඳහන් වාර්තා ඉදිරිපත් කර යුතුය.**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (ඇ ආකෘතිය)

(ii) පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට් පත

(iii) අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් තත් අයදුම් පත්‍ර පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් කර පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම් හා වෙනත් තාක්ෂණික අංශයන් සම්බන්ධයෙන්ද සැලකිල්ලට ගෙන නිෂ්පාදනය කිරීමට හෝ ආනයනය කිරීමට හෝ විකිණීමට හෝ පාවිච්චි කිරීමට හෝ ලබා දිය යුතු පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ඔබ වෙත සති තුනක් ඇතුළත ලබා දිය යුතුය. තත් වාර්තාව ලැබී දින තුනක් ඇතුළත එම අයදුම්පත සමඟ අවශ්‍ය කරන සියලුම ලියකියවිලි වල <u>සහතික කළ ඡායා පිටපත් පමණක්</u> ( දිස්ත්‍රික් ලේකම් හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ යුතුය.) සමඟ බලපත්‍ර අධිකාරිගේ ස්වකීය නිර්දේශය ( 10 ආකෘතිය ) මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර බලපත්‍රය නිකුත් කිරීමේ ලිපිය පමණක් ඔබ වෙත ආපසු එවනු ලැබේ. නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකට මාගේ බලය දීමේ යොමු අංකය සඳහන් කළ යුතුය.

(9) නමුත් විශේෂයෙන්ම උත්සව කාලයේදී ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා විකිණීම හෝ සෑපයීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී සිදුවීමට ඉඩ ඇති ප්‍රමාදය සැලකිල්ලට ගෙන ඉහත සඳහන් වාර්තා නිවැරදි මෙන්ම සම්පූර්ණ වේ නම්, ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා විකිණීමේ ප්‍රමාණය කි. ග්‍රෑම් 250 (දෙසිය පනහයි) ඉක්ම නොවන්නේ නම් මාගේ ආවරණ අනුමැතියට යටත්ව විකිණීමේ හෝ සැපයීමේ බලපත්‍රයක් නිකුත් කිරීමට මෙයින් ඔබට බලය දෙනු ලැබේ. මාගේ ආවරණ අනුමැතියට යටත්ව නිකුත් කරන ලද බලපත්‍රයට අදාල අයදුම්පත සමඟ <u>සියලුම වාර්තාවල සහතික කළ ඡායා පිටපත් පමණක්</u> ( දිස්ත්‍රික් ලේකම් හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර දිස්ත්‍රික් ලේකම් හෝ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ යුතුය.) බලපත්‍රය නිකුත් කළ දින සිට දින 07 ක් ඇතුළත මාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. එම බලපත්‍රයේ අංකය හා නිකුත් කළ දිනය, ඔබගේ නිර්දේශයේ ( 10 ආකෘතිය ) සඳහන් කර එවිය යුතුය.

(10) ඔබගේ දිස්ත්‍රික්කයේ සිටින ගල් වෙඩි බෙහෙත් හා ආරක්ෂිත සේවා නූල් නිෂ්පාදකයන් විසින් මාසිකව නිෂ්පාදනය කරනු ලබන ගල් වෙඩි බෙහෙත් හා ආරක්ෂිත සේවා නූල් ප්‍රමාණ, විකුණූ ප්‍රමාණ, ඉතිරි ප්‍රමාණ හා විකුණූ පුද්ගලයින් පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කර ඊළඟ මාසයේ 10 වන දිනට පෙර මා වෙත එවිය යුතුය.

## 13. <u>පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර අලුත් කිරීම</u>

නිකුත් කරන සියලුම පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර සෑම වර්ෂයකම ජුනි 30 වෙනි දින අවලංගු වේ. 1969 අංක 33 දරණ සංශෝධිත පුපුරන ද්‍රව්‍ය පනත ප්‍රකාර අලුත් කිරීම සඳහා ලැබෙන සියලුම අයදුම් පත් මැයි මස 31 වෙනි දිනට පෙර ඔබ වෙත ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව අලුත් කිරීම සඳහා ලැබෙන සියලුම අයදුම් පත් වලින් බලපත්‍ර ගාස්තුව හා සමාන මුදලක් දඩ වශයෙන් අය කර ගෙන අලුත් කළ යුතුය. බලපත්‍ර අලුත් කිරීමේදී පොලිස් අධිකාරි / පොලිස් ස්ථානාධිපති විසින් නිර්දේශ කරන ලද පොලිස් නිශ්කාෂණ වාර්තාව නිර්දේශ කර ඇති දිනයේ සිට අවුරුදු 01 ක් සඳහා වලංගු වේ. <u>පුපුරන ද්‍රව්‍ය විකිණීම සඳහා ආනයනය කිරීම, පුපුරන ද්‍රව්‍ය විකිණීම හා පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍ර ලබාගන්නා අයදුම්කරුවන්ගේ පොලිස් වාර්තාව පොලිස් අධිකාරි විසින් නිර්දේශ කර තිබිය යුතුය</u>.

## 14. පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නැතිවීම

(1) බලපත්‍රයක් නැතිවූ විගස බලපත්‍රලාභියා විසින් නැතිවීම පිළිබඳව බලපත්‍ර අධිකාරී වන දිස්ත්‍රික් ලේකම්/දිසාපති, සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක හා ආසන්නතම පොලිසියේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දිය යුතුය.

(2) නැති වී ඇති බලපත්‍රය සම්බන්ධව බලපත්‍ර අධිකාරී විසින් පූර්ණ පරීක්ෂණයක් පවත්වා, නැතිවීම පිළිබඳව පැමිණිලි කර දින සිට දින 21ක් ඇතුළත ඔබ විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගය ද අලුත් බලපත්‍රයක් නිකුත් කර යුත්තේද යන්න පිළිබඳව සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ වාර්තාව ද පොලිස් වාර්තාව සමඟ ඔබගේ නිර්දේශ මා වෙත එවිය යුතුය. ඒ අනුව ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳව මා විසින් තීරණය කරනු ඇත.

## 15. පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර ලාභීන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම

### (අ) දිස්ත්‍රික් බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම

දිස්ත්‍රික් බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය ලබා දෙන ලෙස සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙත කරනු ලබන ඉල්ලීම ( 6 'ආ' ආකෘතිය ), ඔහු / ඇය විසින් මීට කලින් ලබා ගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය, විකුණූ ප්‍රමාණය, ඉතිරි ප්‍රමාණය ( 11 ආකෘතිය ) හා 9 ආකෘතිය ආකාරයට සකස් කළ බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් පවත්වා ගෙනු ලබන තොග පොතේ අදාල වකවානුව තුළ විකුණූ පුද්ගලයින් පිළිබඳ විස්තර සහිත තොග පොතේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ ඡායා පිටපත ද සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය ද මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර ඒ බව බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාට දැනුම් දෙනු ලැබේ.

### (ආ) ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම

(1) ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන්ට පුපුරන ද්‍රව්‍ය නිකුත් කළ යුත්තේ ඔබගේ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාගෙන් පමණි. ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන් විසින් පවත්වා ගෙන යනු ලබන දෛනික පුපුරන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලේඛනය ( 13 අ ආකෘතිය ) ආකාරයට සකසා ගත යුතුය. තවද ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන් විසින් අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම, දෛනික පුපුරන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ලේඛනය ( 13 අ ආකෘතිය ) හා නිෂ්පාදන බලපත්‍රය සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙත ඉදිරිපත් කළ යුතුය. එම ලිපි ලේඛන සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් අධීක්ෂණය කර දැනට අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය වර්ග හා ප්‍රමාණ, දිස්ත්‍රික්කයේ නම් කරනු ලබන බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නකුගෙන් ලබා ගැනීමට සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභියා වෙත අනුමැති ලිපිය (7 'ආ' ආකෘතිය) ලබා දිය යුතුය.

(2) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් අනුමැතිය ලබා දුන් ප්‍රමාණය පමණක් ගිනි කෙළි භාණ්ඩ හා ~~රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභියා වෙත නිකුත්~~ කර බලපත්‍රයේ පසුපිට බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් පිටසන් කළ යුතුය. දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය ගබඩාවේ නිකුත් කිරීම භාර පොලිස් නිලධාරියා ( 1956 අංක 21 දරණ පුපුරන ද්‍රව්‍ය ආඥාපනතේ 3 (2) වගන්තියට අනුව සැරයන්වරයකුගේ නිලයට වඩා පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියෙක් විය යුතුය.) එම පිටසන පරීක්ෂා කර බලපත්‍රයේ පිටසන් කළ ස්ථානයේ ඔහු විසින් අත්සන් කළ යුතුය.

(3) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් ගිනි කෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභියා වෙත ලබා දුන් අනුමැති ලිපියේ මුල් පිටපත (7 'ආ' ආකෘතිය) බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් සුරක්ෂිතව ළඟ තබා ගත යුතුය. එම ලිපිය ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට ඔහුගේ වගකීම වේ. බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් පවත්වා ගෙනු ලබන තොග පොත (9 ආකෘතිය) ආකාරයට සකසා ගත යුතුය. ගිනි කෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභියා වෙත නිකුත් කළ පුපුරන ද්‍රව්‍ය වර්ග හා ප්‍රමාණ, බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාගේ තොග පොතේ සඳහන් කර තිබිය යුතුය.

## 16. <u>නිකුත් කළ ඇති ප්‍රමාණය වැඩි කරන ලෙස හෝ වෙනත් පුපුරන ද්‍රව්‍ය වර්ගයක් එකතු කර ගැනීම සඳහා ඉල්ලීම</u>

(i) කැණීම් කටයුතු සඳහා ලබා දී ඇති අවසර පත්‍රවල නිකුත් කළ ඇති ප්‍රමාණය වැඩි කිරීමට හෝ වෙනත් පුපුරන ද්‍රව්‍ය වර්ගයක් ඇතුළත් කිරීමට කරන ලද ඉල්ලීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබා ගන්නා ලද බලපත්‍රය හෝ විශේෂ අවසරය, අයදුම්පත්‍රය, පරිසර ආරක්ෂණ බලපත්‍රය, දැනට ලබා දී ඇති අවසරපත්‍රයේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් සහතික කළ ඡායා පිටපත, සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය සමඟ බලපත්‍ර අධිකාරී විසින් පිටපත් දෙකකින් යුතුව ස්වකීය නිර්දේශය ( 4 ආකෘතිය ) මා වෙත ඉදිරිපත් කළ යුතුය. වැඩි කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර ඒ බව ඔබට දැනුම් දෙනු ලැබේ.

(ii) ගිනිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිෂ්පාදන බලපත්‍ර ලාභීන්ට නිකුත් කළ ඇති ප්‍රමාණය වැඩි කිරීමට හෝ වෙනත් පුපුරන ද්‍රව්‍ය වර්ගයක් ඇතුළත් කිරීමට කරන ලද ඉල්ලීමේදී සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය සමඟ මා වෙත ඉදිරිපත් කළ යුතුය. වැඩි කළ යුතු ප්‍රමාණය මා විසින් නියම කරනු ලබන අතර ඒ බව ඔබට දැනුම් දෙනු ලැබේ.

## 17. <u>පතරොම් නිකුත් කිරීම</u>

### (1) <u>තුවක්කු බලපත්‍ර</u>

මෙම තුවක්කු බලපත්‍ර

(අ) කෘෂිකාර්මික කටයුතු සඳහා

(ආ) කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා

වශයෙන් වර්ග දෙකකට බෙදේ.

(අ) කෘෂිකාර්මික

කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා දී ඇති තුවක්කුවලට පතරොම් නිකුත් කළ යුත්තේ ඔබ විසිනි. එම තුවක්කුවලට අවුරුද්දේ මුල් භාගය (මුල් මාස හය) ඇතුළත උපරිම වශයෙන් එස්. ජී. පතරොම් 12 (දොළහයි) ක් හා සැහැල්ලු ප්‍රමාණයේ (අංක 4, අංක 6 හෝ අංක 8) පතරොම් 08 (අටයි) කින් යුක්තව හෝ තනිකරම සැහැල්ලු ප්‍රමාණයේ පතරොම් 20 (විස්සයි) ක් නිකුත් කළ හැක. මෙම ප්‍රමාණයම අවුරුද්දේ දෙවන භාගය වෙනුවෙන් ද නිකුත් කළ හැක. නව තුවක්කු බලපත්‍රයක් සඳහා මුල්වරට පතරොම් නිකුත් කිරීම හැර අනික් සෑම අවස්ථාවකදී නිකුත් කළ යුත්තේ තුවක්කු බලපත්‍රලාභියා විසින් භාර දෙනු ලබන පාවිච්චි කරන ලද හිස් පතරොම් කොපු ප්‍රමාණයට සමාන ප්‍රමාණයකි. තවද ඉහත පතරොම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන තුවක්කු බලපත්‍රලාභීන්ගේ ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් තීරණය කර ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

(ආ) කෘෂිකාර්මික නොවන

කෘෂිකාර්මික නොවන කටයුතු (දේපල ආරක්ෂාව) සඳහා ලබා දී ඇති බෝර 12 හා 16 එස්. ජී. පතරොම් තුවක්කු හා රිපිටර් සඳහා අවුරුද්දට සැහැල්ලු ප්‍රමාණයේ (අංක 4, අංක 6 හෝ අංක 8) පතරොම් 10 (දහයයි) ක් ඔබ විසින් නිකුත් කළ යුතුය. නව තුවක්කු බලපත්‍රයක් සඳහා මුල්වරට පතරොම් නිකුත් කිරීම හැර අනික් සෑම අවස්ථාවකදී නිකුත් කළ යුත්තේ තුවක්කු බලපත්‍රලාභියා විසින් භාර දෙනු ලබන පාවිච්චි කරන ලද හිස් පතරොම් කොපු ප්‍රමාණයට සමාන ප්‍රමාණයකි. තවද ඉහත පතරොම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන තුවක්කු බලපත්‍රලාභීන්ගේ ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු ප්‍රමාණය මා විසින් තීරණය කර ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

(2) මලල ක්‍රීඩා උත්සව

මලල ක්‍රීඩා උත්සව සඳහා අවශ්‍ය වන පුහු පතරොම් ලබා ගැනීමට ඔබේ අභිමතය පරිදි අවසර පත්‍ර නිකුත් කළ හැකිය. එසේ නිකුත් කිරීමට පෙර මලල ක්‍රීඩා උත්සවය පැවැත්වීමට නියමිත ස්ථානයට ආසන්නතම පොලිසියේ පොලිස් ස්ථානාධිපතිගේ නිර්දේශය ලබා ගත යුතුය. නිකුත් කළ අවසර පත්‍රයේ අංකය හා දිනය සඳහන් කර මා වෙත දැනුම් දිය යුතුය.

(3) වෙනත් තුවක්කු සඳහා

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, බැංකු හා වෙනත් ආරක්ෂක ආයතන වෙත නිකුත් කරන ලද තුවක්කු සඳහා ද ස්වයංක්‍රීය පිස්තෝල, රිවොල්වර, රයිෆල් හා වෙනත් ගිනිඅවි සඳහා ද නිකුත් කළ යුතු පතරොම් වර්ගය හා ප්‍රමාණය මා විසින් තීරණය කර නිකුත් කරනු ලැබේ.

(4) තුවක්කු බලපත්‍රලාභීන් විසින් පතරොම් මිල දී ගැනීම

(අ) ඔබගේ දිස්ත්‍රික්කය තුළ කෘෂිකාර්මික කටයුතු හා කෘෂිකාර්මික නොවන කටයුතු (දේපල ආරක්ෂාව) සඳහා ලබා දී ඇති බෝර 12 හා 16 එස්. ජී. පතරොම් තුවක්කු හා රිපිටර් සඳහා සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් පතරොම් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා තුවක්කු බලපත්‍රලාභියා විසින්

තමාගේ තුවක්කු බලපත්‍රයේ මුල් පිටපත සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙත ඉදිරිපත් කළ යුතුය. එම තුවක්කු බලපත්‍රයේ මුල් පිටපත පරීක්ෂා කර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නකුගෙන් අවශ්‍ය පතරොම් ලබා ගැනීමට අනුමැති ලිපිය (7 ඇ ආකෘතිය), තුවක්කු බලපත්‍රලාභියා වෙත ලබා දිය යුතුය. මෙම අනුමැති ලිපිය බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා වෙත ඉදිරිපත් කර අවශ්‍ය පතරොම් ප්‍රමාණය තුවක්කු බලපත්‍රලාභියාට නිකුත් කළ යුතුය. නිකුත් කළ ප්‍රමාණය තුවක්කු බලපත්‍රයේ පසුපිට බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් පිටසන් කළ යුතුය. නව තුවක්කු බලපත්‍රයක් සඳහා මුල්වරට පතරොම් නිකුත් කිරීම හැර අනික් සෑම අවස්ථාවකදී නිකුත් කළ යුත්තේ තුවක්කු බලපත්‍රලාභියා විසින් භාර දෙනු ලබන පාවිච්චි කරන ලද හිස් පතරොම් කොපු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් පමණක් බව දිස්ත්‍රික්කයේ සියලුම ලියාපදිංචි බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් දැනුවත් කළ යුතුය.

(ආ) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් තුවක්කු බලපත්‍ර ලාභියා වෙත ලබා දුන් අනුමැති ලිපියේ මුල් පිටපත (7 'ඇ' ආකෘතිය) බලයලත් පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් සුරක්ෂිතව ළඟ තබා ගත යුතුය. එම ලිපිය ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට ඔහුගේ වගකීම වේ. බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් පවත්වා ගෙනු ලබන තොග පොත (9 ආකෘතිය) ආකාරයට සකසා ගත යුතුය. තුවක්කු බලපත්‍ර ලාභියා වෙත නිකුත් කළ පතරොම් ප්‍රමාණය, බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නාගේ තොග පොතේ සඳහන් කර තිබිය යුතුය. තවද තුවක්කු බලපත්‍රලාභියා විසින් පාවිච්චි කරන ලද හිස් පතරොම් කොපු ප්‍රමාණය, බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නා විසින් භාර ගත යුතු අතර ඒ පිළිබඳ වෙනම ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් එම පතරොම් නිකුත් කිරීම, ඉතිරි ප්‍රමාණය හා බලපත්‍රලාභී පුපුරන ද්‍රව්‍ය සපයන්නන් විසින් පවත්වා ගෙනු ලබන තොග පොත අධීක්ෂණය කර ඒ පිළිබඳව මාසික වාර්තාව ඊළඟ මාසයේ 10 වන දිනට පෙර මා වෙත එවිය යුතුය. භාර ගන්නා හිස් පතරොම් කොපු ප්‍රමාණ පිළිබඳ වාර්තාව මාස 03 කට වරක් මා වෙත එවිය යුතු අතර ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳව මා උපදෙස් දෙනු ඇත.

## 18. පනත යටතේ තබාගත යුතු වාර්තා

පනත යටතේ තමන් විසින් තබාගත යුතු වාර්තා, අවසර පත්‍රය අවලංගු වූ දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් ගතවන තුරු ආරක්ෂා කොට තබාගත යුතු බව සියලුම අවසර පත්‍රලාභීන් වෙත හා බලපත්‍රය අවලංගු වූ දින සිට අවුරුදු පහක කාල සීමාවක් ගතවන තුරු ආරක්ෂා කොට තබාගත යුතු බව සියලුම බලපත්‍රලාභීන් වෙත උපදෙස් දිය යුතුය. තවද තොරතුරු පනත අනුව ඔබ විසින් නිකුත් කරන ලද සියලුම අවසර පත්‍ර හා බලපත්‍රවල තොරතුරු, එම අවසර පත්‍ර හා බලපත්‍ර නිකුත් කළ දින සිට අවුරුදු දහයක කාල සීමාවක් ගතවන තුරු ආරක්ෂා කොට තබාගත යුතුය.

## 19. අයදුම් පත් ප්‍රතික්ෂේප කිරීම

අවසරපත්‍රයක් හෝ බලපත්‍රයක් නිකුත් කිරීම අවශ්‍ය නොවන බවට ඔබ සෑහීමකට පත් වන අවස්ථාවකදී එබඳු අයදුම් පත් මා වෙත යොමු නොකර ම ඒ බව අයදුම්කරු වෙත ලිඛිතව ලියාපදිංචි තැපැලෙන් දැනුම් දිය යුතුය. එම දැනුම් දීමේ දී ප්‍රතික්ෂේප කිරීමට හේතු සඳහන් කළ යුතුය.

## 20. අවසරපත්‍ර ලත් /බලපත්‍ර ලත් ස්ථානයක සිදුවන අනතුරු

අවසරපත්‍ර ලත් /බලපත්‍ර ලත් ස්ථානයක සිදුවන හදිසි අනතුරු පිළිබඳව අවසරපත්‍ර ලාභියා හෝ බලපත්‍ර ලාභියා විසින් ආසන්නත ම පොලිසියේ පොලිස් ස්ථානාධිපති, බලපත්‍ර අධිකාරී වන දිස්ත්‍රික් ලේකම් /දිසාපති හා සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක ට වහාම දැනුම් දිය යුතුය. තොරතුරු සැලවුණු වහාම පොලිස් ස්ථානාධිපති හා සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක එම හදිසි අනතුර සිදු වී ඇති ස්ථානයට ගොස් හදිසි අනතුර හෝ පිපිරීමට තුඩුදුන් හේතුව සම්බන්ධව පරීක්ෂණයක් කර, අවසරපත්‍ර ලාභියා/බලපත්‍ර ලාභියාට විරුද්ධව ගත යුතු ක්‍රියාමාර්ගයක් ඇත්නම් ඒ පිළිබඳව යෝජනා ද ඇතුළත් පරීක්ෂණ වාර්තාව මා වෙත ඉදිරිපත් කළ යුතුය. මාගේ පූර්ව අනුමැතියකින් තොරව එම අවසරපත්‍ර ලත් /බලපත්‍ර ලත් ස්ථානයේ කටයුතු නැවත ආරම්භ කිරීමට ඉඩ නොදිය යුතුය.

## 21. අල්ලාගත් හා ඉතිරිව ඇති පුපුරන ද්‍රව්‍ය

අවසර පත්‍රය/බලපත්‍රය නියමිත දිනට අවලංගු වීමකදී හෝ වෙනත් හේතුවක් නිසා නියමිත දිනට කලින් අවලංගු කිරීමකදී අවසරපත්‍ර ලාභියෙකු හෝ බලපත්‍ර ලාභියෙකු සන්තකයේ ඉතිරි වී ඇති පුපුරන ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු මා වෙත හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් බලපත්‍ර නිකුත් කර ඇති ව්‍යාපෘතියක් නම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ද දැනුම් දිය යුතුය. එම පුපුරන ද්‍රව්‍ය පිළිබඳව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මා විසින් උපදෙස් දීමට කටයුතු කරනු ඇත.

## 22. කල් ඉකුත් වී ඇති/ භාවිතයට ගත නොහැකි පුපුරන ද්‍රව්‍ය

යම්කිසි පුපුරන ද්‍රව්‍යයක් කල් ඉකුත් වී ඇති හෝ භාවිතයට ගත නොහැකි තත්වයේ ඇත්නම් මාස 03 කට වරක් මා වෙත වාර්තා කළ යුතු අතර එම පුපුරන ද්‍රව්‍ය පිළිබඳව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මා විසින් උපදෙස් දීමට කටයුතු කරනු ඇත.

## 23. පුපුරන ද්‍රව්‍ය පනත යටතේ නඩු පැවරීම

පුපුරන ද්‍රව්‍ය පනත යටතේ නඩු පැවරිය යුත්තේ පොලිසිය විසිනි. එබඳු නඩු පැවරීම සම්බන්ධව අවශ්‍ය වන විටක සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් පොලිසියට සහාය ලබාදිය යුතුය. පොලිසිය විසින් යම් අවසර පත්‍රලාභියෙකුට හෝ බලපත්‍ර ලාභියෙකුට විරුද්ධව නඩු පවරන විට ඒ බව බලපත්‍ර අධිකාරී වන දිස්ත්‍රික් ලේකම් /දිසාපති, සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක හා මා වෙත දැනුම් දිය යුතුය. එසේම එම නඩුවේ තීන්දුව ද දන්වා සිටිය යුතුය.

## 24. ගිනිකෙළි සංදර්ශන

ගිනිකෙළි සංදර්ශන සඳහා අවසරය, සංදර්ශනය පවත්වන ස්ථානයට අදාල පොලිසියේ පොලිස් ස්ථානාධිපතිගෙන් ලබාගත යුතුය. මෙබඳු සංදර්ශන පැවැත්විය හැක්කේ ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදන බලපත්‍ර ලාභීන්ට පමණි. ගිනිකෙළි සංදර්ශනය පැවැත්වීමට ඇස්තමේන්තු කළ මුදල හා සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ වාර්තාව මා වෙත එවීමෙන් පසු නිකුත් කළ යුතු පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය මා විසින් තීරණය කරනු ලබන අතර ඒ බව මා විසින් ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදන බලපත්‍ර ලාභියාට දැනුම් දෙනු ලැබේ.

**25.** <u>වෙනත් අරමුණකට පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර / බලපත්‍ර යොදවා ගැනීම</u>

පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර / බලපත්‍ර විකිණීම හා අන්සතු කිරීම තහනම් වේ. යම්කිසි පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර / බලපත්‍ර භාවිතා නොකරන්නේ නම් භාවිතා නොකරන කාල පරිච්ඡේදය ඇතුළත ඔබ විසින් එම පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර / බලපත්‍රවල මුල් පිටපත් භාරගත යුතුය. භාවිතා නොකරනු ලබන පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර / බලපත්‍ර සඳහා පුපුරන ද්‍රව්‍ය නිකුත් නොකිරීම සහතික කරලීම සඳහා ඔබ විසින් ක්‍රියාමාර්ග ගත යුතුය.

**26.** ආකෘති පත්‍ර වෙනස් කර නොමැති අතර පසුගිය චක්‍රලේඛයේ ආකෘති පත්‍ර භාවිතා කරන ලෙස දැනුම් දෙමි. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී ඔබට මුහුණපාන්නට සිදුවන යම් යම් අපහසුතා ඇත්නම් ඒවා මාගේ අවධානය සඳහා යොමු කළ යුතුය.

**ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)**
**ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්**
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | :- | කා.දැ.ස. හා අ.ක.ස |
| 2. | ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී | :- | කා.දැ.ස. . |
| 3. | යුධ හමුදාපති | :- | කා.දැ.ස. |
| 4. | නාවික හමුදාපති | :- | කා.දැ.ස. හා අ.ක.ස. |
| 5. | පොලිස්පති | :- | සියලුම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන්, පොලිස් අධිකාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම සඳහා |
| 6. | අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | :- | කා.දැ.ස. හා කැණීම් පිළිබඳ වාර්තා ලබා දීම සඳහා |
| 7. | අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය | :- | කා.දැ.ස. හා අ.ක.ස. |
| 8. | සාමාන්‍යාධිකාරී, සී/ස ශ්‍රී ලංකා රජයේ (විවිධ) නීතිගත සංස්ථාව | :- | කා.දැ.ස. හා අ.ක.ස. |
| 9. | සියලුම සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකවරුන් | :- | කා.දැ.ස. හා අ.ක.ස. |
| 10. | අධ්‍යක්ෂ, නාවික හමුදා CEFAP ඒකකය | :- | කා.දැ.ස. හා අ.ක.ස. |